# පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
## උතුරු මැද පළාත - අනුරාධපුර

මෙම අධිකාරියේ කාර්මික නිලධාරී පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා තම අයදුම්පත් 2025.10.24 දිනට පෙර පහත ලිපිනය වෙත යොමු කරන මෙන් දන්වමි.

## කාර්මික නිලධාරී - 03 ශ්‍රේණිය

**ශ්‍රේණිය හා වැටුප් පරිමාණය** – 03 ශ්‍රේණිය – 50,540 - 10 x 540 - 7 x 630 - 4 x 1,080 - 20 x 1,280 - 90,270

**බාහිර අයදුම්කරුවන්**

I. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු ආයතනයකින් වසර 04 ක පූර්ණ කාලීන (සිවිල් ඉංජිනේරු) පාඨමාලාව (NDES)

II. ජාතික තාක්ෂණික සහතික පත්‍ර විභාගය (NCT) – සිවිල් ඉංජිනේරු විභාගය සමත් වීම සමග වසර 05 ක ක්ෂේත්‍ර පළපුරුද්ද

III. උසස් ජාතික තාක්ෂණික (සිවිල්) ඩිප්ලෝමාව (HNDT)

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය

V. රජයේ කාර්මික නිලධාරී විභාගයේ (GTO) I කොටස හා II කොටස

VI. සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රය අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) පහ (05) වැනි මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් i හෝ ii)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහාවන සුදුසුකම් අදාළ වේ.

II. ජාතික තාක්ෂණික සහතික පත්‍ර විභාගය (NCT) සමත් හෝ රජයේ කාර්මික නිලධාරී විභාගයේ (GTO) I හා II සමත්ව තිබීම

**සමග**

පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩ පරිපාලක තනතුරේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වෙනත් සුදුසුකම් හා කොන්දේසි**

➢ අයදුම්කරුවන් බඳවා ගන්නා දිනට අදළ සුදුසුකම් සියලු ආකාරයෙන් සම්පූර්ණ කර තිබිය යුතුය.

➢ බඳවා ගන්නා දිනට වයස අවුරුදු 45 ට වඩා අඩුවිය යුතුය. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ, රජයේ අර්ධ රාජ්‍ය පූර්ව ආයතනයක (සංස්ථාව, මණ්ඩලය, ව්‍යවස්ථාපිත ආයතන) සේවයේ නියුක්ත අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

➢ රාජ්‍ය සේවා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු / සංස්ථා / මණ්ඩල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

➢ අයදුම්කරුවන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු අයදුම්පත සකස්කර එවිය යුතු අතර තමා පිළිබඳව තොරතුරු ලබාගත හැකි දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.

➢ මෙම තනතුර හුදෙක් කොන්ත්‍රාත් පදනම මත වන අතර වසරක කාලයක් සඳහා වේ. එහෙයින් අධිකාරියේ අභිමතය පරිදි මෙම කාලය දීර්ඝ කිරීම හෝ නොකිරීම සිදු කළ හැක.

➢ බඳවාගන්නා තනතුරු සංඛ්‍යාව 07 කි.

➢ මෙම කොන්ත්‍රාත් තනතුර සඳහා මාසිකව රු. 61,179.00 (43,379.00 + 17,800.00) ක දීමනාවක් ඇතුළුව අධිකාරිය මගින් ගෙවනු ලබන මාසික දීමනාවද ගෙවනු ලැබේ.

➢ අයදුම්කරුට විශේෂ සුදුසුකම් සහ / හෝ පළපුරුද්ද ඇත්තේ නම් ඒවා සැලකිල්ලට ගෙන ඉහළ ශ්‍රේණියක හෝ යම් ශ්‍රේණියක වැටුප් පරිමාණයෙහි සුදුසු වැටුප් පියවරක තබනු ලැබේ.

➢ ස්ථිර පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේදී කොන්ත්‍රාත් පදනම මත කරනු ලැබූ සේවය පිළිබඳ කාර්යක්ෂමතාව සලකා බලනු ලැබේ.

**ලිපිනය :**

**සාමාන්‍යාධිකාරී,**
**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**එච්.බී. සේමසිංහ මාවත, අනුරාධපුර,**
**උතුරු මැද පළාත.**